# පළමුවැනි පරිශිෂ්ටය

(අ) ලංකා පාර්ලිමේන්තුව විසින් 1962 දී පනවන ලද, ප්‍රධාන නීති වලින් උපුටා ගත් මහ බැංකුවේ සහ බැංකු සංස්ථාවල කටයුතු හා ගනු දෙනු වලට අදාළ, කොටස්.

(ආ) 1962 දී මුදල් මණ්ඩලය විසින් සකස් කරගන්නා ලද ප්‍රධාන පාලන විධිවිධාන.

# අ—ලංකා පාර්ලිමේන්තුව විසින් 1962 දී පනවන ලද, ප්‍රධාන නීති වලින් උපුටාගත්, මහ බැංකුවේ සහ බැංකු ආයතන වල කටයුතු හා ගනුදෙනු වලට අදළ කොටස්

## (i) *1962 අංක 2 දරන විදේශීය ණය (සංශෝධන) පනත

**2.** 1957 අංක 29 දරන විදේශීය ණය පනතෙහි 5 වැනි වගන්තියෙහි ''ජාත්‍යන්තර සංවිධානය'' යන වචන වලට ''ජාත්‍යන්තර සංවිධානය හෝ ලංකාණ්ඩුව විසින් අනුමත කරනු ලැබිය හැකි ලංකාවෙන් පිටත වූ එවැනි පුද්ගල මණ්ඩල'' යන වචන අදේශ කිරීමෙන් මෙසේ සංශොධනය කරනු ලැබේ.

**3.** 1958 අංක 34 දරන පනතින් සංශොධිත ආදයම් බදු ආඥ පනතේ 7 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තියෙහි ( *ffff* ) ඡෙදයට ඉක්බිතිව පහත දක්වෙන අලුත් ඡෙදය ඇතුළත් කිරීමෙන් සංශොධනය කරනු ලැබේ:—

''( *fffff* ) ලංකාණ්ඩුව විසින් අනුමත කරනු ලැබිය හැකි ලංකාවෙන් පිටත වූ එවැනි ඕනෑම පුද්ගල මණ්ඩලයක් විසින් එකී ආණ්ඩුවට මුදලින්, භාණ්ඩවලින්, සේවා වලින් හෝ වෙනත් අනෙක් ලෙසකින් දෙනු ලබන ආධාර වලින් එකී පුද්ගල මණ්ඩලය ලබන ලාභ සහ ආදයම''.

### සටහන

1957 අංක 29 දරන විදේශීය ණය පනතේ 5 වැනි වගන්තිය ''විදේශීය ණය'' යන්නෙහි අර්ථ නිරූපනයට ''ලංකාණ්ඩුව විසින් අනුමත කරනු ලැබිය හැකි ලංකාවෙන් පිටත වූ පුද්ගල මණ්ඩලයක් විසින් දෙනු ලබන ණයක්'' යන්න අනෙක් කරුණු අතර, ඇතුළත් කිරීමට, එකී වගන්තිය මේ පනතේ 2 වැනි වගන්තියෙන් සංශොධනය කරයි.

1958 අංක 34 දරන පනතින් සංශොධිත ආදයම් බදු ආඥා පනතේ, 7 වැනි වගන්තිය, (242 පරිච්ඡෙදය) ලංකාණ්ඩුව විසින් කරනු ලැබිය හැකි, ලංකාවෙන් පිටත වූ පුද්ගල මණ්ඩලයක් විසින් ලංකාණ්ඩුවට මුදලින්, භාණ්ඩ වලින්, සේවා වලින් හෝ වෙනත් අනෙක් ලෙසකින් දෙනු ලබන ආධාරයකින්, එකී පුද්ගල මණ්ඩලය ලබන ලාභ සහ ආදයම, ආදයම් බදු වලින් නිදහස් කිරීම සඳහා (ඉහත කී වගන්තිය) මේ පනතේ 3 වැනි වගන්තියෙන් සංශොධනය කරයි.

## *1962 අංක 9 දරන මුදල් රෙගුලාසි (සංශෝධන) පනත

**2.** මෙහි මින් මතු ''ප්‍රධාන පනත'' යනුවෙන් හඳුන්වනු ලබන, 1961 අංක 65 දරන මූල්‍ය පනතෙහි, 18 වැනි වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශොධනය කරනු ලැබේ:—

(අ) එකී වගන්තියෙහි, (1) වැනි උප වගන්තියේ.

''ශුද්ධ ආදයමට වැඩිවන ප්‍රමාණයෙන්'' යන වචන වලට ''මුදලට ඔහුගේ ශුද්ධ ආදයම වැඩිවන ප්‍රමාණයෙන්'' ද යන වචන ආදේශ කිරීමෙන් : සහ

(ආ) එකී වගන්තියෙහි (2) වැනි උප වගන්තියේ ''ඒ සඳහා පිහිටුවා ඇති ජාතික සංවර්ධන අරමුදලට'' යන වචන වෙනුවට, ''ජාතික සංවර්ධන අරමුදලට'' යන වචන ආදේශ කිරීමෙන් ;

**3.** ප්‍රධාන පනතෙහි 19 වැනි වගන්තිය, එහි (2) වැනි උප වගන්තියේ (ආ) ඡෙදය වෙනුවට පහත සඳහන් ඡෙදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශොධනය කරනු ලැබේ:—

'' ආ පුද්ගලයකු විසින් ගෙයක් මිලයට ගන්නා හෝ ඉදිකරන හෝ අවස්ථාවෙහි ඔහු සතුව ගෙයක් නොමැති නම් සිය වාසය සඳහා ගෙයක් මිලයට ගැනීම හෝ ඉදි කිරීම හෝ සඳහා කැරෙන ආයෝජන,''

හෝ

**4.** ප්‍රධාන පනතෙහි 21 වැනි වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශොධනය කරනු ලැබේ.

---

*මෙම පනතෙහි නම එහි පළමුවැනි වගන්තියෙන් හඳුන්වනු ලැබේ.

(අ) ''පුද්ගලයා'' යන්නෙහි අර්ථ නිරූපනයට පෙරාතුවම පහත සඳහන් අර්ථ නිරූපනය ඇතුළත් කිරීමෙන්:—

''තක්සේරු කළ හැකි ආදයම'' යන්නට ආදයම් බදු ආඥාපනතේ දී එයට දී ඇති අර්ථයම විය යුතුය.

(ආ) ''ශුද්ධ ආදයම'' යන්නෙහි අර්ථ නිරූපනයෙහි, ''එසේ වුවද තවදුරටත්, යන වචන වල සිට ඉඩ දෙනු නො ලැබේ'' යන වචන තෙක් ඇති සියලුම වචන වලට පහත සඳහන් වචන ආදේශ කිරීමෙන්.

''එසේ වුවද, තවදුරටත්, අඩු කරන ලද විශ්‍රාම වැටුපක් ලබන පුද්ගලයකුගේ තක්සේරු කළ හැකි ආදයම තීරණය කිරීමෙහි දී, ඔහුගේ අඩු නොකළ විශ්‍රාම වැටුපෙහි සහ අඩු කළ විශ්‍රාම වැටුපෙහි වෙනස වශයෙන් ගැණෙන ප්‍රමාණය ඔහුගේ තක්සේරු කළ හැකි ආදයමට එකතු කළ යුතු ය''.

(ඇ) ''අනේවාසික සමාගම'' යන්නෙහි අර්ථ නිරූපනයෙහි සෙමිකෝලනයට නැවතීමේ ලකුණක් ආදේශ කිරීමෙන්.

(ඈ) ''තක්සේරු වර්ෂය'' යන්නට දී ඇති අර්ථ නිරූපනය ලොප් කිරීමෙන්.

**5.** ප්‍රධාන පනතේ 30 වැනි වගන්තියේ ''එවැනි පුද්ගලයකුට සහ'' යන වචන වල සිට ''නිකුත් කැරුන'' යන වචන තෙක් ඇති සියලුම වචන හා සංඛ්‍යා වලට පහත සඳහන් ඡෙදය ආදේශ කිරීමෙන් මෙයින් සංශොධනය කරනු ලැබේ:—

''එවැනි පුද්ගලයකුට සහ ආදයම් බදු ආඥාපනතේ අවශ්‍යතා අනුව එම පුද්ගලයා මූලිකයා ලෙස ගැණෙන පවුලේ පුද්ගලයිනට ආහාර පාලන පනත යටතේ පනවන ලද ආහාර පාලන රෙගුලාසි යටතේ නිකුත් කැරුන සලාක පොත''

**6.** ප්‍රධාන පනතේ 31 වැනි වගන්තියේ ''ගෙවන පිළිවෙළ'' යන වචන වලට ''කොමසාරිස් වරයා විසින් රජයේ සහල් සලාකාධාරය තීරණය කරන, තක්සේරු කරන හා ගෙවන පිළිවෙළ'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශොධනය කරනු ලැබේ.

**7.** ප්‍රධාන පනතේ 32 වැනි වගන්තිය අවලංගු කොට එයට පහත සඳහන් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:—

''32. මෙම කොටසේ පසුව එන විධිවිධානයන් ආදයම් බදු ආඥාපනතේ 7 වැනි වගන්තිය යටතේ හෝ ලංකාණ්ඩුව හා වෙනත් රටක ආණ්ඩුවක් අතර ඇති වන ද්විත්ව බදු සහන ගිවිසුම් යටතේ හෝ ආදයම් බද්දෙන් නිදහස් වන ලැබීම් සම්බන්ධයෙන් අදල නොවේ''.

**8.** ප්‍රධාන පනතේ 33 වැනි වගන්තිය, එම වගන්තියේ 2 වැනි උප වගන්තියේ ''එකී සේවකයාගේ සේව්‍යයා'' යන වචන වලට ''එකී සේවකයාගේ සේව්‍යයා හෝ එකී ලැබීම් ගෙවීමේ වගකීම දරන පුද්ගලයාගේ හෝ'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශොධනය කරනු ලැබේ.

**9.** ප්‍රධාන පනතේ 35 වැනි වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශොධනය කරනු ලැබේ :—

(අ) ''ඔහුගේ සේව්‍යයා විසින්'' යන වචන වලට ''ඔහුගේ සේව්‍යයා විසින් හෝ ලැබීම් ගෙවීමේ වගකීම දරන පුද්ගලයා විසින් හෝ'' යන වචන ආදේශ කිරීමෙන්.

හා

(ආ) එකී කොටසේ තීරු සටහනෙහි ''සේව්‍යයා විසින් සංවර්ධන බද්ද'' යන වචන වලට ''සංවර්ධන බද්ද'' යන වචන ආදේශ කිරීමෙන්.

**10.** ප්‍රධාන පනතේ 36 වැනි වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ''සේවකයකු විසින් ජාතික සංවර්ධන බද්දට'' යන වචනවල සිට ''කිසියම් මාසයක් සඳහා'' යන වචන තෙක් ඇති සියලුම වචන වලට ''කිසියම් මාසයක් සඳහා ජාතික සංවර්ධන බද්දට යටත් වන සේවකයකුගෙන් සේව්‍යයකු විසින් හෝ එකී සේවකයාගේ පඩි ලැබීම් ගෙවීම බාර පුද්ගලයා විසින් හෝ'' යන වචන ආදේශ කිරීමෙන්.

(ආ) ''එකී සේව්‍යයා'' යන වචන වලට ''එකී සේව්‍යයා හෝ පුද්ගලයා හෝ'' යන වචන ආදේශ කිරීමෙන්.

(ඇ) එම කොටසේ තීරු සටහනෙහි ''සේව්‍යයන් විසින් එකතු කරනු ලබන ජාතික සංවර්ධන බද්ද'' යන වචන වලට ''කොමසාරිස්වරයාට ගෙවන ජාතික සංවර්ධන බද්ද'' යන වචන ආදේශ කිරීමෙන්.

**11.** 36 වැනි වගන්තියට ඉක්බිතිවම අනතුරුව පහත සඳහන් නව වගන්තිය මෙයින් ඇතුලත් කරනු ලැබේ. එය ප්‍රධාන පනතෙහි 36 අ වගන්තිය වශයෙන් ක්‍රියාත්මක වනු ඇත:—

''36 අ. කිසියම් සේවකයකු සම්බන්ධ වූ ජාතික සංවර්ධන බද්ද ඔහුගේ සේව්‍යයාගෙන් හෝ ඔහුගේ ලැබීම් ගෙවීම බාර පුද්ගලයාගෙන් හෝ අයකර ගත නොහැක්කේ නම් කොමසාරිස්වරයා විසින් එකී සේවකයාට ජාතික සංවර්ධන බදු මුදල ගෙවන ලෙස ලියවිල්ලකින් දැන්වීමක් කළ විට එකී සේවකයා විසින් දැන්වීමෙහි නියමිත කාලය තුළ දී එම මුදල කොමසාරිස්වරයාට ගෙවිය යුතු ය''.

**12.** ප්‍රධාන පනතේ 37 වැනි වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ''ඔහුගේ සේව්‍යයා විසින්'' යන වචනවල සිට—''කොමසාරිස්වරයාට ගෙවීමට'' යන වචන තෙක් ඇති සියලුම වචන වලට ''ඔහුගේ සේව්‍යයා විසින් හෝ ඔහුගේ පඩි ලැබීම් ගෙවීම බාර පුද්ගලයා විසින් හෝ නියමිත ක්‍රමයට කොමසාරිස්වරයාට ගෙවීමට හෝ එකී සේව්‍යයා හෝ පුද්ගලයා හෝ ගෙවීමට අසමත් වන්නේ නම් එකී සේවකයා විසින් කොමසාරිස්වරයාට ගෙවීම'' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ''අය කර ගනු ලැබේ'' යන වචන වලට ''නොගෙවා පැහැර හැරිය මුදල් ලෙස සලකා පැහැර හැරිය තැනැත්තාගෙන් අය කර ගනු ලැබේ''.

**13.** ප්‍රධාන පනතේ 39 වැනි වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ''සේවකයා'' යන්නට දී ඇති අර්ථ නිරූපනයට පහත සඳහන් අර්ථ නිරූපනය ආදේශ කිරීමෙන්:—

''සේවකයා'' යන්නට

(අ) රජයේ සේවකයකු වශයෙන් පඩි ලබන තනතුරක් දරන සෑම පුද්ගලයෙක්ම ඇතුළත් වේ.

(ආ) ලංකාවෙන් පිටත පදිංචි පුද්ගලයකු විසින් රැකියාවේ යොදවනු ලබන පුද්ගලයෙක් ඇතුළත් වේ. එහෙත්, ලංකාවේ වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රැකියාවක් හෝ කරන හෝ ක්‍රියාත්මක කරන හෝ පුද්ගලයකු විසින් රැකියාවේ යොදවනු ලබන ලංකාවෙන් පිටත පදිංචි පුද්ගලයෙක් ඇතුළත් නොවේ.

(ඇ) පහත සඳහන් අය ඇතුළත් වේ:—

i උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සභාපති හා උප සභාපති,

ii නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ කථානායක, උප කථානායක, කාරක සභාවල උප සභාපති හා විරුද්ධ පක්ෂයේ නායක,

(iii) උත්තර මන්ත්‍රී මණ්ඩලයේ කාර්ය සම්පාදක, නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ කාර්ය සම්පාදකගේ හෝ නිලධාරි මණ්ඩලයේ සාමාජිකයෙක්,

(iv) ඇමතිවරයෙක් හෝ පාර්ලිමේන්තු ලේකම්වරයෙක් හෝ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන විධායක නිලධාරියා,

(v) උත්තර මන්ත්‍රීවරයකු හෝ මහජන මන්ත්‍රීවරයකු වශයෙන් දීමනාවක් ලැබීමේ හේතුවෙන් උත්තර මන්ත්‍රීවරයකු හෝ මහජන මන්ත්‍රීවරයකු,

(vi) රාජ්‍ය සේවා කොමිසමේ සාමාජිකයකු,

(vii) අධිකරණ සේවා කොමිසමේ සාමාජිකයකු,

(viii) අල්ලස් පනත යටතේ අල්ලස් අධිකරණ සභා පිහිටුවීම සඳහා පත් කරන ලද මණ්ඩලයෙහි සාමාජිකයකු,

(ix) ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද ඕනෑම ම ණ්ඩලයක අධිකරණ සභාවක හෝ කොමිසමක හෝ සාමාජිකයකු,

(x) ආදායම් බදු ආඥා පනත යටතේ පත් කරන ලද බලය ලත් විනිශ්චය කරුවකු,

(xi) සමාගමක හෝ සංයුක්ත මණ්ඩලයක හෝ අධ්‍යක්ෂවරයකු;

(2) සේව්‍යයා යන්නට දී ඇති අර්ථ නිරූපනයට පහත සඳහන් අර්ථ නිරූපනය ආදේශ කිරීමෙන්:—

''සේව්‍යයා'' යන්නෙන්.

(අ) රජයේ දෙපාර්තමේන්තුවක රැකියාවෙහි යෙදෙන එහි ප්‍රධානයා නොවන පුද්ගලයකු සම්බන්ධයෙන් නම්, එකී දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා අදහස් කැරේ.

(ආ) ලංකාවෙන් පිටත පදිංචි පුද්ගලයකු විසින් රැකියාවේ යොදවනු ලබන පුද්ගලයකු සම්බන්ධයෙන් නම්, පළමුව සඳහන් කළ පුද්ගලයාගේ ලංකාවේ නියෝජිතයා හෝ ඇටෝර්නි බලකාරයා හෝ පළමුව සඳහන් කළ පුද්ගලයා විසින් ලංකාවේ කැරෙන ව්‍යාපාරයේ බාරකරු හෝ කළමනාකරු හෝ අදහස් කැරේ.

(3) ''දීමනා'' යන්නට දී ඇති අර්ථ නිරූපනයට පහත සඳහන් අර්ථ නිරූපනය ආදේශ කිරීමෙන්:—

''දීමනා'' යනුවෙන් අදහස් කරනුයේ සේවකයකුට ගෙවිය යුතු පඩිය, වැටුප්, ගාස්තු හෝ දීමනා හා සේවකයාට ලැබෙන හෝ සේවකයාගේ ප්‍රයෝජනය සඳහා ඔහු රැකියාවේ යෙදී සිටිය දී දෙනු ලබන මුදලින් කැරෙන ගෙවීමය. එහෙත් සේව්‍යයා විසින් සේවකයා සඳහා ඇමතිවරයා අනුමත කළ විශ්‍රාම වැටුපකට හෝ අර්ථ සාධක අරමුදලකට හෝ ගෙවනු ලබන දායක දීමනා ප්‍රමාණයන් හෝ දෙන ලද දීමනා හෝ සේවකයා රැකියාවේ යෙදී සිටිය දී දරන ලද වියදම් ආපසු ගෙවීම් වශයෙන් කැරුන ගෙවීම් හෝ මෙයට ඇතුළත් නොවේ.

**14.** ප්‍රධාන පනතේ 40 වැනි වගන්තිය ''එවකට ලියා පදිංචි වී'' යන වචන වලට ''එවකට ලියා පදිංචි වී එකී බලධාරියාගෙන් ලියා පදිංචි වූ බවට සහතිකයක් ලබා ගෙන'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශොධනය කරනු ලැබේ.

**15.** ප්‍රධාන පනතේ 41 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශොධනය කරනු ලැබේ:—

(1) එම උප වගන්තියේ (අ) ඡේදයේ ''එම ලියාපදිංචි වීම සඳහා'' යන වචන වලට ''එකී ලියාපදිංචි වීම සඳහා ඔහු විසින් යම් ගාස්තුවක් ගෙවිය යුතු නම් එම ලියා පදිංචි වීම සඳහා'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශොධනය කරනු ලැබේ.

(2) එම උප වගන්තියෙහි විශේෂ ඡේදයේ ''ගාස්තුව'' යන වචනයට ''යම් ගාස්තුවක් වේ නම්'' යන වචන ආදේශ කිරීමෙන්; හා

(3) එම වගන්තියේ (2) වැනි උප වගන්තිය අවලංගු කිරීමෙන්.

**16.** ප්‍රධාන පනතේ 42 වැනි වගන්තියේ ''උචිත ගාස්තුව'' යන වචන වලට ''යම් උචිත ගාස්තුවක් වේ නම් '' යන වචන ආදේශ කිරීමෙන්.

**17.** ප්‍රධාන පනතේ 43 වැනි වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම වගන්තිය, 43 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය වශයෙන් නැවත අංක යෙදීමෙන්.

(ආ) එම වගන්තියේ නැවත අංක යෙදූ (1) වැනි උප වගන්තියේ ''වර්ෂයකට රුපියල්'' යන වචන වලට ''රුපියල්'' යන වචනය ආදේශ කිරීමෙන් ; හා

(ඇ) එම උප වගන්තිය අවසානයට පහත සඳහන් නව උප වගන්තිය එකතු කිරීමෙන් :—

(2). (1) වැනි උප වගන්තියෙහි කරුණු ගැන නොසලකා, යම් පුද්ගලයකු විසින් 41 (1) වැනි වගන්තිය යටතේ බලය ලත් නිලධාරියාට ආදයම් පිළිබඳ ප්‍රකාශයක් කළ පසු එකී ප්‍රකාශය සාවද්‍ය යැයි ඔහුට හැඟී ගියේ නම් නිසියාකාර පරීක්ෂා කිරීමෙන් පසු එකී පුද්ගලයා විසින් ප්‍රකාශිත ආදයම වැඩි කිරීම ඔහුට ඕනෑම විටක දී කළ හැකිය. එසේ ම එකී පුද්ගලයා විසින්,

(අ) ප්‍රකාශිත පරිදි, ආදයම කෙරෙහි වූ ජාතික සංවර්ධන බද්ද ගෙවා ඇත්නම්, ඔහු විසින් ප්‍රකාශිත ආදයම හා එසේ වැඩිකළ ආදයම අතර ඇති වෙනසින් සියයට හතරකට සමාන ප්‍රමාණයක් ඔහු විසින් ජාතික සංවර්ධන බද්ද වශයෙන් ගෙවිය යුතු ය.

(ආ) ඔහු ජාතික සංවර්ධන බද්දක් ගෙවා නොමැති නම්, එසේ වැඩි කළ ආදයමෙන් සියයට හතරකට සමාන ප්‍රමාණයක් ජාතික සංවර්ධන බද්ද වශයෙන් ඔහු විසින් ගෙවිය යුතු ය.

මේ අනුව එකී පුද්ගලයා විසින් ප්‍රකාශිත ආදයම වැඩිකිරීමේ හේතුවෙන් ලියාපදිංචි කිරීමේ ගාස්තුවෙහි ඇති වන යම් වෙනසක් වෙතොත් ඔහු විසින් එය ගෙවිය යුතු ය''.

**18.** ප්‍රධාන පනතේ 45 වැනි වගන්තිය ''එකී සහතිකයෙහි නියමිත කාලය තුළ දී'' යන වචන වලට ''එකී අරමුදල ගෙවිය යුතු වූ විට'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**19.** ප්‍රධාන පනතේ 47 වැනි වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ''එහි අයිතිකරුවා වශයෙන් ලියා පදිංචි වී'' යන වචන වලට ''එකී බලධාරියාගෙන් ලියා පදිංචි වීමේ සහතිකයක් ලබා'' යන වචන ආදේශ කිරීමෙන්.

(2) එම වගන්තියට ඇති විශේෂ වගන්තියේ (ආ) ඡේදයේ ''වැඩ කොටස්'' යන වචනයට ''වැඩ කොටස් හෝ'' යන වචන ආදේශ කිරීමෙන්.

(3) එකී විශේෂ වගන්තියෙහි (ආ) ඡේදයට ඉක්බිතිවම අනතුරුව පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

''(ඇ) ලංකාවේ හෝ වෙනත් තැනක හෝ බල පැවැත්වෙන ඕනෑම නීතියක් මගින් ව්‍යවස්ථාපිත හෝ ලියා පදිංචි කරන ලද හෝ සමාගමක් විසින් හෝ සංයුක්ත මණ්ඩලයක් විසින්''

**20.** ප්‍රධාන පනතේ 48 වැනි වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එකී වගන්තියේ (1) වැනි උප වගන්තිය—

(i) එකී උප වගන්තියේ (අ) ඡේදයේ ''නියම ගාස්තුව'' යන වචනවලට ''එකී ලියාපදිංචි කිරීම සඳහා යම් ගාස්තුවක් ගෙවිය යුතු නම් එම නියම ගාස්තුව'' යන වචන ආදේශ කිරීමෙන්.

(ii) එකී උප වගන්තියේ (ආ) ඡේදය ''එහි අයිතිකරු'' යන වචන වලට ''ව්‍යාපාරය පවත්වා ගෙන යන පුද්ගලයා'' යන වචන ආදේශ කිරීමෙන්.

(iii) ''බලධාරියාට සපයා නොමැති නම්'' යන වචන වල සිට එකී උප වගන්තියේ අවසානය තෙක් ඇති සියලුම වචන වලට ''බලධාරියාට සපයා නොමැති නම්'' යන වචන ආදේශ කිරීමෙන් ; හා

(2) එකී වගන්තියේ (2) වැනි උප වගන්තිය අවලංගු කිරීමෙන්.

**21.** ප්‍රධාන පනතේ 49 වැනි වගන්තිය, එකී වගන්තියේ (1) වැනි උප වගන්තියෙහි ''නියම ගාස්තුව'' යන වචන වලට ''යම් නියම ගාස්තුවක් වේ නම් එය'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**22.** ප්‍රධාන පනතේ 50 වැනි වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එම වගන්තිය 50 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය වශයෙන් නැවත අංක යෙදීමෙන් ; හා

(ආ) එම උප වගන්තියේ අවසානයට පහත සඳහන් අලුත් උප වගන්තිය එකතු කිරීමෙන්:-

(2) (1) වැනි උප වගන්තියෙහි කරුණු කිසිවක් නොසලකා, යම් පුද්ගලයකු විසින් 48 (1) වැනි වගන්තිය යටතේ බලය ලත් නිලධාරියාට ආදායම් පිළිබඳ ප්‍රකාශයක් කළ පසු, එකී ප්‍රකාශය සාවද්‍ය යයි ඔහුට හැඟී ගියේ නම් නිසියාකාර පරීක්ෂා කිරීමෙන් ඉක්බිතිව එකී පුද්ගලයා විසින් ප්‍රකාශිත ආදායම ඔහුට වැඩි කළ හැකිය. එසේ වැඩි කැරුණු ආදායම රුපියල් තුන් දහස් හය සියයකට වැඩි වේ නම්, එකී පුද්ගලයා විසින්,

(අ) ඔහු විසින් ප්‍රකාශිත ආදායමට ජාතික සංවර්ධන බද්ද ගෙවා ඇත්නම්, ඔහු විසින් ප්‍රකාශිත ආදායම හා එසේ වැඩි කැරුනු ආදායම අතර ඇති වෙනසින් සියයට හතරකට සමාන ප්‍රමාණයක් ජාතික සංවර්ධන බද්ද වශයෙන් ගෙවීම, හෝ

(ආ) ඔහු ජාතික සංවර්ධන බද්දක් ගෙවා නොමැති නම්, එසේ වැඩි කැරුනු ආදාය මෙන් සියයට හතරකට සමාන ප්‍රමාණයක් ජාතික සංවර්ධන බද්ද වශයෙන් ගෙවීම, හෝ ඔහු කළ යුතු ය.

මේ අනුව, එකී පුද්ගලයා විසින් ප්‍රකාශිත ආදායම්, වැඩිකිරීමේ හේතුවෙන් ලියා පදිංචි කිරීමේ ගාස්තුවෙහි වෙනසක් ඇති වේ නම් එය ඔහු විසින් ගෙවිය යුතු ය.

**23.** ප්‍රධාන පනතේ 52 වැනි වගන්තිය ''එකී සහතිකයෙහි නියමිත කාලය තුළ දී'' යන වචන වලට ''එකී වාර මුදල් ගෙවිය යුතු වූ විට'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**24.** ප්‍රධාන පනතේ 54 වැනි වගන්තිය, ''කුමන හෝ සහතිකයක්'' යන වචන වලට ''කුමන හෝ කුවිතාන්සියක්'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**25.** ප්‍රධාන පනතේ 55 වැනි වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ''එකී වර්ෂය තුළ දී'' යන වචන වලට ''එකී තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂය තුළ දී'' යන වචන ආදේශ කිරීමෙන්, හා

(ආ) ''එකී පුද්ගලයාගේ'' යන වචන වලට ''එකී පුද්ගලයන්ගේ එකී තක්සේරු වර්ෂය සඳහා වූ'' යන වචන ආදේශ කිරීමෙන්.

**26.** ප්‍රධාන පනතේ 56 වැනි වගන්තිය, එකී වගන්තියේ (ඇ) ඡේදයෙහි ''එහි අයිතිකරුවන්'' යන වචනවලට ''එහි අයිතිකරුවන් වශයෙන් ලියා පදිංචි වූ පුද්ගලයන්'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**27.** ප්‍රධාන පනතේ 59 වැනි වගන්තිය මෙයින් අවලංගු කොට එයට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"59. (1) මෙම පනතේ කලින් සඳහන් විධිවිධාන කිසිවක් නොසලකා, පුද්ගලයෙකුගේ රැකියාවලින්, වෘත්තීන්ගෙන් හෝ ව්‍යාපාරයන්ගෙන් හෝ ඔහුගේ රැකියාවෙන් හා වෘත්තියෙන් හෝ ඔහුගේ රැකියාවෙන් හා ව්‍යාපාරයෙන් හෝ ඔහුගේ වෘත්තියෙන් හා ව්‍යාපාරයෙන් හෝ ඔහුගේ රැකියාවෙන්, වෘත්තියෙන් හා ව්‍යාපාරයෙන් හෝ ලැබෙන මුළු ආදායම රුපියල් තුන් දහස් හය සියයකට වැඩි වේ නම් එකී මුළු ආදාය මෙන් එකී පුද්ගලයා විසින් මෙම පනතේ vi වැනි කොටසේ හෝ vii වැනි කොටසේ හෝ විධිවිධාන යටතේ ජාතික සංවර්ධන බද්දට ගෙවන ලද යම් ප්‍රමාණයක් වේනොත් එය අඩු කිරීමෙන් පසු මුළු ආදායමෙන් සියයට හතරකට සමාන ප්‍රමාණයක් එකී පුද්ගලයා විසින් ජාතික සංවර්ධන බදු කොමසාරිස්ට ගෙවිය යුතු ය.

එහෙත් ජාතික සංවර්ධන බද්ද පැනවීම කරණකොට ගෙන එකී මුළු ආදායම රුපියල් තුන් දහස් හය සියයකට අඩු වේ නම්, එකී පුද්ගලයා විසින් එකී ආදායම හා රුපියල් තුන්දහස් හය සියය අතර වෙනස ගෙවිය යුතු ය.

(2) මෙම වගන්තියේ අවශ්‍යතා සඳහා යම් පුද්ගලයකු සම්බන්ධ "මුළු ආදායම" යන්නෙන්, එකී පුද්ගලයා විසින් ඔහුගේ රැකියාවලින්, වෘත්තීන්ගෙන් හා ව්‍යාපාරයන් ගෙන් උපයාගත් මුළු ආදායම අදහස් කැරේ. ඔහුගේ රැකියාවලින් ලැබෙන ආදායම යන්නෙන් 1961 ඔක්තෝබර් 1 වැනිදයින් ●ටන් ගන්නා වර්ෂයේ හෝ ඊට පසු වර්ෂයක ඔහුගේ රැකියාවලින් ලැබෙන මාසික පඩිනඩිවල එකතුව ද, වෘත්තීන්ගෙන් හෝ ව්‍යාපාරයන්ගෙන් ලැබෙන ආදායම යන්නෙන් ආදායම් බදු ආඥා පනතේ අභිමතාර්ථයන් සඳහා ගණනය කරන පරිදි, එකී වෘත්තීන් හෝ ව්‍යාපාරයන් හෝ ලියා පදිංචි කළ යුතු වර්ෂයට පෙර වර්ෂයේ ආදායම ගැනේ.

(3) 1 වැනි උප වගන්තිය යටතේ ජාතික සංවර්ධන බද්ද ගෙවිය යුතු පුද්ගලයන් දිවුරුම් ප්‍රකාශයන් කිරීම හා එකී පුද්ගලයන් විසින් ජාතික සංවර්ධන බද්ද ගෙවීමේ පිළිවෙළ පිළිබඳ රෙගුලාසි සම්පාදනය කළ යුතු ය".

**28.** 59 වැනි වගන්තියට ඉක්බිතිවම අනතුරුව පහත සඳහන් අළුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලැබේ. එය ප්‍රධාන පනතේ 59 **(අ)** වගන්තිය වශයෙන් බල පැවැත්වෙනු ඇත:—

"59 අ (1) මෙම පනතේ අභිමතාර්ථයන් සඳහා ජාතික සංවර්ධන අරමුදල යනු වෙන් අරමුදලක් පිහිටුවනු ලැබේ.

(2) මෙම පනත යටතේ ජාතික සංවර්ධන බද්ද වශයෙන් ගෙවනු ලබන හෝ අය කරනු ලබන හෝ සියළුම මුදල් ජාතික සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ය.

(3) ඇමතිවරයා විසින්, නියෝජිත මන්ත්‍රී ම ණ්ඩලයේ පූර්ව අනුමැතිය ඇතිව, ජාතික සංවර්ධන අරමුදලෙන් ආපසු ලබා ගත යුතු මුදල් ප්‍රමාණ යන් ද, එකී ප්‍රමාණයන් වැය කළ යුතු කටයුතු ද, තීරණය කළ යුතු ය. එකී මුදල් ප්‍රමාණයන් හැර වෙනත් මුදල් අරමුදලෙන් ආපසු ලබා ගත යුතු නොවේ".

**29.** ප්‍රධාන පනතේ 60 වැනි වගන්තියේ 2 වැනි උප වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එකී උප වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම අනතුරුව පහත සඳහන් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(අඅ). ජාතික සංවර්ධන බද්ද හෝ 30 වැනි වගන්තිය යටතේ පැන වූ රජයේ සහල් ආධාර ප්‍රමාණය හෝ එකතු කිරීම සඳහා අවශ්‍ය පෝර්ම නියම කිරීම" හා

(2) එකී උප වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම අනතුරුව පහත සඳහන් අළුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

''(ඇඇ) ජාතික සංවර්ධන බද්ද අයකිරීමේ අභිමතාර්ථයන් සඳහා සේවාය-යන් හා පඩි නඩි ගෙවීම් බාර පුද්ගලයන් ලියා පදිංචි කිරීම හා එකී සේවායයන් හෝ පුද්ගලයන් විසින් බද්දට යටත් සේවකයන්ට ඔවුන්ගේ පඩිනඩිවලින් අඩු කරන ලද ප්‍රමාණයන් දක්වෙන සහතික නිකුත් කිරීම''

**30.** ප්‍රධාන පනතේ 61 වැනි වගන්තිය මෙයින් අවලංගු කොට එයට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

''61. යම් පුද්ගලයෙක්,

(අ) මෙම පනතේ යම් විධිවිධානයක් හෝ එය යටතේ සකස් කරන ලද රෙගුලාසි යක් හෝ උල්ලංඝනය කරයි නම් හෝ ඉටු කිරීමට අපොහොසත් වෙයි නම්, හෝ

(ආ) වැරදීමකින් හෝ ප්‍රමාද දෝෂයකින් හෝ හැර වෙනත් ලෙසකින් ආදයම පිළිබඳ සාවද්‍ය ප්‍රකාශයක් කරයි නම් ; හෝ

(ඇ) 45 වැනි වගන්තිය යටතේ ඔහුගේ වෘත්තියේ ලියා පදිංචිය තහනම් කොට තිබිය දී එහි නියුක්ත වෙයි නම්, හෝ

(ඇ) 52 වැනි වගන්තිය යටතේ ඔහුගේ ව්‍යාපාරයේ ලියා පදිංචිය තහනම් කොට තිබිය දී එය කරයි නම් හෝ

ඔහු වරදක් කළා වන අතර, ඔහුට විරුද්ධව මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු වශයෙන් නඩු විභාග කොට ඔහු වරදකරු කරනු ලැබූ පසු රුපියල් දහසකට නොවැඩි වන දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි වන කාලයක දෙවර්ගයෙන් කුමන වර්ගයක හෝ සිර දඬුවමකට හෝ දඩය හා සිර දඬුවම යන දෙකටම හෝ යටත් විය යුතු ය''.

**31.** 61 වැනි වගන්තියට ඉක්බිතිවම අනතුරුව පහත සඳහන් අළුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලැබේ. එය 61 **(අ)** වගන්තිය වශයෙන් බලපැවැත්වෙනු ඇත:—

''61 අ මෙම පනත යටතේ වූ වරදක් පුද්ගල කණ්ඩායමක් විසින් කරනු ලැබූවේ නම්,

(අ) එකී පුද්ගල කණ්ඩායම සංයුක්ත මණ්ඩලයක් නම්, එකී සංයුක්ත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂකවරයෙක් ම හා නිලධාරියෙක්ම ; හා

(ආ) එම පුද්ගල ක ්ඩායම වෙළෙඳ ආයතනයක් නම්, එම වෙළෙඳ ආයතනයේ සෑම කොටස්කරුවෙක් ම,

එම වරදට වරදකරුවෙකු වෙයි.

එහෙත්, එම සංයුක්ත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධාරියකු හෝ එකී වෙළෙඳ ආයතනයේ කොටස්කරුවකු හෝ ඔහුට නොදැනුවත්වම එම වරද කැරුන බව හෝ එම වරද නොකිරීමට ඔහු නිසි පරිශ්‍රම යෙදූ බව හෝ ඔප්පු කළ හොත් ඔහු එම වරදට වරදකරු නොවන්නේ ය''.

**32.** ප්‍රධාන පනතේ 63 වැනි වගන්තිය ''කොමසාරිස් ''යන වචනයේ අර්ථ නිරූපනයට ඉක්බිතිවම අනතුරුව පහත සඳහන් අර්ථ නිරූපනය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශොධනය කරනු ලැබේ :—

''වෘත්තිය'' යන්නට පුද්ගලයකු විසින් කරනු ලබන ඕනෑම රැකියාවක් ඇතුළත් වේ.

**33.** ප්‍රධාන පනතට අයත් දෙවැනි උප ලේඛනය පහත සඳහන් පරිදි මෙයින් සංශොධනය කරනු ලැබේ:—

(අ) ''ශුද්ධ ආදයම'' යන වචන ලොප් කිරීමෙන් ; හා

(ආ) ''විවාහක යුවළ'' යන වචන වලට ''පුරුෂයා හා භාර්යාව'' යන වචන ආදේශ කිරීමෙන්.

**34.** ප්‍රධාන පනතට අයත් තුන් වැනි උප ලේඛනය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උප ලේඛනයේ (අ) ඡේදයේ ''රුපියල් 10,000 කට අඩු'' යන වචන හා සංඛ්‍යා වලට ''රුපියල් 5,000 කට නොඅඩු එහෙත්, රුපියල් 10,000 කට අඩු'' යන වචන හා සංඛ්‍යා ආදේශ කිරීමෙන්,

(2) එම උප ලේඛනයේ (ආ) ඡේදයේ ''රුපියල් 10,000 කට අඩු'' යන වචන හා සංඛ්‍යා වලට ''රුපියල් 10,000 කට නොඅඩු එහෙත්, රුපියල් 15,000 කට අඩු'' යන වචන හා සංඛ්‍යා ආදේශ කිරීමෙන් හා

(3) එම උප ලේඛනයේ (ඇ) ඡේදයේ ''රුපියල් 20,000 කට අඩු'' යන වචන හා සංඛ්‍යාවලට ''රුපියල් 15,000 කට නොඅඩු එහෙත් රුපියල් 20,000 කට අඩු'' යන වචන හා සංඛ්‍යා ආදේශ කිරීමෙන්.

**35.** මෙම පනතේ කලින් සඳහන් කළ විධිවිධාන මගින් කරන ලද ප්‍රධාන පනතේ සංශෝධනයන් සෑම අවශ්‍යතාවයක් සඳහාම, ප්‍රධාන පනත බලපැවැත් වූ දිනයේ සිටම බල පැවැත්වූ ලෙස සලකනු ලැබේ.

## (iii) 1962 අංක 25 දරන රක්ෂණ පාලන පනත.

මේ පනතේ විධිවිධාන යටතේ,

යම් පංතියක රක්ෂණ ව්‍යාපාරයක් කර ගෙන යාමට බලය ලත් පුද්ගලයෙකු ලෙස පනත යටතේ ලියා පදිංචි වී ඇති පුද්ගලයකු හැර,

(අ) කිසිම පුද්ගලයකු නියමිත දිනය වන 1962 නොවැම්බර් 1 වැනි දින හෝ ඊට පෙරාතුව කුමන පන්තියක හෝ රක්ෂණ ව්‍යාපාරයක්, ලංකාවේ කරනු ලැබූවද, තවදුරටත් එවැනි පංතියක රක්ෂණ ව්‍යාපාරයක් නොකළ යුතු ය.

(ආ) ජීවිත රක්ෂණ ව්‍යාපාර හැර වෙන කිසිම පන්තියක රක්ෂණ ව්‍යාපාරයක් කිසිම පුද්ගලයකු විසින් කර ගෙන නොයා යුතු ය.

මේ පනතේ 18 වැනි වගන්තියේ විධිවිධානවලට අනුව, කිසිම රක්ෂකයකු සතු ලංකාවේ ඇති වත්කම්, රක්ෂකයාගේ නමින් මිස වෙන ලෙසකින් නොතැබිය යුතු ය. මේ පනතේ 19 වැනි වගන්තියේ විධිවිධානවලට අනුව, ලංකාවේ දී රක්ෂණය කැරුණ රක්ෂණ සහතිකයක් හෝ රක්ෂණ ගිවිසුමක් හෝ යටතේ ඇති රක්ෂණ අවදානමක්, ඇමැති තුමා විසින් නියම කොට, ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන රක්ෂකයකු හෝ රක්ෂණ සමාගමක් හෝ වෙත හැර, ලංකාවේ කුමන පුද්ගලයකු හෝ වෙත ප්‍රති–රක්ෂණය නොකළ යුතු ය.

ජීවිත රක්ෂණ සම්බන්ධයෙන්, 1962 ජනවාරි පළමු වැනි දිනට පෙරාතුව, ලංකාවේ ජීවිත රක්ෂණ ව්‍යාපාරයක් කරන ලද හැම රක්ෂකයකු හෝ සමාගමක් විසින්ම හෝ ජීවිත රක්ෂණ සහතික නිකුත් කොට, එහි වගකීම් නියමිත දිනයට නොගෙවා ඇති හැම රක්ෂකයකු හෝ සමාගමක් විසින් ම හෝ, එවැනි රක්ෂණ සහතික යටතේ ගෙවීමට ඇති වගකීම් වලට ගෙවීමට සෑහෙන ප්‍රමාණයක වත්කම් ලංකාවේ වත්කම් වලින් තබා ගත යුතු යැයි ව්‍යවස්ථාගත කොට ඇත. එසේ ම ඉහත කී අවශ්‍යතාව සඳහා රක්ෂකයකු විසින් ලංකාවේ තබා ගත යුතු වත්කම් වලින් යටත් පිරිසෙයින් භාගයක්වත්, රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතු යැයි ද ඉතිරි කොටස, මේ පනතේ අවශ්‍යතා සඳහා පත් කරනු ලබන, රක්ෂණ පාලක විසින් දන්වන හා ලියා අනුමතකරන වත්කම් වර්ග වලින් ගත යුතු යැ යි ද, ව්‍යවස්ථා ගත කොට ඇත.

23(1) වගන්තියේ විධිවිධානයනට අනුව තනි වශයෙන් හෝ වෙනත් ව්‍යාපාර වලට අමතරව හෝ ලංකාවේ ජීවිත රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යන හැම රක්ෂකයකුම,

(අ) ජීවිත රක්ෂණ අරමුදල නමින් හැඳින්වෙන අරමුදලක් වෙන ම ඇති කොට, එවැනි රක්ෂකයකු විසින් කර ගෙන යන ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙන් ලැබෙන මුදල් එකී අරමුදලට බැර කළ යුතු ය.

සහ

(ආ) ජීවිත රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධ වත්කම් අනෙකුත් පංතිවල රක්ෂණ ව්‍යාපාරවල වත්කම් වලින් වෙන් ව තැබිය යුතු ය.

ලංකාවේ හැම රක්ෂකයකු විසින් ම තමා විසින් කරන ලද රක්ෂණ ව්‍යාපාර සම්බන්ධව ද, පිටරට රක්ෂකයකු විසින් නම් ලංකාවේදී කරන ලද රක්ෂණ සම්බන්ධව ද, වාර්ෂික ගිණුම් පිළියෙළ කිරීමේ විධිවිධාන මේ පනතේ යොද ඇත. මේ පනතේ විධිවිධාන යටතේ, සපයා ඇති වාර්තා, වැරදි යයි හෝ සදෙස් යයි හෝ රක්ෂණ පාලකට පෙනී යන්නේ නම්, ඒ සොයා බලා පරීක්ෂා කිරීමට රක්ෂණ පාලකට බලය දී ඇත.

## (iv) *1962 අංක 30 දරන විසර්ජන පනත.

**1962-63 මුදල් වර්ෂයේ සේවා සඳහා ද, එවැනි සේවා සඳහා ලංකාව තුළින් හෝ පිටතින් හෝ ණය ලබා ගැනීමට බලය පැවරීම සඳහාද, එම මුදල් වර්ෂය තුළ රජයේ සමහර කටයුතු සම්බන්ධයෙන්, මුදල් වෙන් කිරීම සඳහා ද, එම මුදල් වර්ෂය තුළ එවැනි කටයුතු සඳහා වියදම් කිරීම සඳහා ද, ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයේ හෝ රජය විසින් සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ද, එම මුදල් එකී ඒකාබද්ධ අරමුදලට නැවත ගෙවීමට ඉඩ සැලැසීමට ද, ඉහත කී කටයුතු වලට සම්බන්ධිතව හෝ අනුශාංගිකව හෝ ඇති කරුණු සඳහා ඉඩ සැලසීමට ද, බලය පැවරෙන පනතෙකි.**

2. (1) කුමන හෝ වියදමක් සඳහා බලය පැවරෙන වෙනත් අනෙක් නීතියකට හානියක් නොවන පරිද්දෙන් 1962 ඔක්තෝබර් 1 වැනිදයින් පටන් ගෙන, 1963 සැප්තැම්බර් 30 වැනිදයින් අවසන් වන, මුදල් වර්ෂයේ සේවාවන් සඳහා, තක්සේරු කරන ලද රජයේ වියදම වන රුපියල් එකසිය අනූහත් කෝටි එකොළොස් ලක්ෂ විසි දහස් හාරසිය පනස් හතර,

(අ) මෙයින් බලය පැවරෙන ගෙවීම්, ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයේ හෝ රජය විසින් සුදුස්සක් කළ හැකි වෙනත් අනෙක් අරමුදලකින් හෝ මුදල් වලින් ද

සහ

(ආ) ලංකාණ්ඩුව වෙනුවෙන් හෝ සඳහා හෝ, ලංකාව තුළින් හෝ පිටතින් හෝ, මුළු වශයෙන් රුපියල් කෝටි 50 කට නොවැඩිව ලබා ගැනීමට මෙයින් බලය පැවරෙන ණය වලින් ද

ලබාගත යුතුය.

මෙහි මීන් පෙර, සඳහන් රුපියල් එකසිය අනූහත් කෝටි එකොළොස් ලක්ෂ විසි දහස් හාරසිය පනස් හතර මේ පනතෙහි පළමු වැනි උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතුය.

(2) මේ වගන්තියේ (1) වැනි උප වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මකවීමේ දී, රජය සඳහා හෝ වෙනුවෙන් හෝ ණය ගැනීම සඳහා බලය පැවරෙන වෙනත් කුමන හෝ ලිඛිත නීතියක විධිවිධාන වලට හානියක් නොවිය යුතුය.

3 (1) මේ පනතේ දෙවැනි උප ලේඛනයේ 1 වැනි තීරුවෙහි නියමිත, එක් එක් කාර්යයන් සඳහා 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ රජයේ ලැබීම්, ඒ ඒ කාර්යයන් සඳහා වෙන් වූ ගිණුමට බැර කළ යුතුයි. එහෙත්, එසේ බැර කරනු ලැබීම්, එම උප ලේඛනයෙහි III වැනි තීරුවෙහි අනුරූප සටහනේ, නියමිත උපරිම සීමාව, නො ඉක්මවිය යුතුය. එවැනි උපරිම සීමාව ඉක්මවා එවැනි කාර්යයන්ගෙන් ලැබෙන ලැබීම්, ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය.

(2) මෙහි 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ, මේ පනතෙහි 2 වැනි උප ලේඛනයේ 1 වැනි තීරුවෙහි නියමිත, එක් එක් කාර්යය උඩ රජය විසින් කැරුන වියදම් එම මුදල් වර්ෂය තුළ එවැනි කාර්යයන්ගෙන් රජයට ලැබෙන ලැබීම් වලින් ගෙවිය යුතුය. එහෙත්, එවැනි වියදම් එම උප ලේඛනයේ II වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම සීමාව නො ඉක්මවිය යුතුයි.

---

*මෙම පනතේ නම එහි පළමු වැනි වගන්තියෙන් හඳුන්වනු ලැබේ.

**(3)** 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය අවසානයේ, මේ පනතේ දෙවැනි උප ලේඛනයේ 1 වැනි තීරුවෙහි නියමිත කුමන කාර්යයක් හෝ සම්බන්ධයෙන් ඉතිරිව ඇති හර ශේෂය, උප ලේඛනයේ IV වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම සීමාව නො ඉක්ම විය යුතුය. එසේම, එම මුදල් වර්ෂය අවසානයේ දී එකී කටයුත්ත සඳහා වූ මුළු වගකීම, එම උප ලේඛනයේ, V වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම සීමාව නො ඉක්මවිය යුතුය.

**(4)** 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ, ඕනෑම අවස්ථාවක මේ පනතේ දෙවැනි උප ලේඛනයේ 1 වැනි තීරුවෙහි, නියමිත කුමන හෝ කාර්යයකින් රජයට ලැබෙන ලැබීම් එවැනි කාර්යයන් සඳහා රජයෙන් කැරෙන වියදම් පියවීමට ප්‍රමාණවත් නොවන්නේ නම්, එවැනි වියදම් පියවීමට මුදල් ඇමති විසින් අවශ්‍ය යැයි හඟින ප්‍රමාණයන් විටින් විට ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයේ හෝ රජයට සුදුස්සක් කළ හැකි වෙනත් අනෙක් අරමුදලකින් හෝ, මුදල් වලින්, අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යැයි මුදල් ඇමති විසින් නියෝගයකින් විධාන කළ හැකිය. එහෙත්, එසේ අත්තිකාරම් වශයෙන් දෙන මුළු ප්‍රමාණය එම උප ලේඛන යෙහි II වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම වැය ප්‍රමාණය නො ඉක්මවිය යුතුය. එවැනි කාර්යයක් සඳහා අත්තිකාරම් වශයෙන් දෙන යම් මුදලක්, මුදල් ඇමති විසින් නියෝගය කින් විධාන කරන පිළිවෙළට ඒකාබද්ධ අරමුදලට නැවත ගෙවිය යුතුය.

**(5)** මේ පනතේ පළමු වැනි උප ලේඛනයේ විධිවිධානානු සාරයෙන්, අංක. 3,5 සහ 7 යන වැය ශීර්ෂ වලට හැර එම උප ලේඛනයේ නියමිත අනෙක් ශීර්ෂයක් යටතේ දැක්වෙන වෙනත් වැය ශීර්ෂයකට, වෙන් කැරුන යම් මුදලක් වැය කොට නොමැති නම් හා වැය කැරෙන ලෙසක් නො පෙනෙන්නේ නම්, භාණ්ඩාගාරයේ ලේකම්ගේ හෝ ඔහු විසින් බලය පවරා ඇති වෙනත් නිලධාරියකු ගේ හෝ නියෝගය අනුව, එම ශීර්ෂය යටතේ වූ වෙනත් වැය ශීර්ෂයකට පැවරිය හැකිය.

**(6)** මේ පනතෙහි දෙවැනි උප ලේඛනයේ II වැනි, III වැනි, IV වැනි හෝ V වැනි තීරුවල නියමිත උපරිම සීමාවන් රජයේ අනුමැතිය ඇතිව, මුදල් ඇමති විසින් නියෝග කිරීමෙන් වෙනස් කළ හැකිය.

**(7)** මේ පනතෙහි දෙවැනි උප ලේඛනයේ උචිත තීරුවලට යම් කටයුත්තක් සහ එවැනි කටයුත්තකට සම්බන්ධ සියලුම හෝ කුමන හෝ උපරිම ප්‍රමාණයක් එකතු කොට, පාර්ලි මේන්තු යෝජනා සම්මුතියකින් සංශෝධනය කළ හැකිය.

### උපලේඛන පිළිබඳ සටහන.

මේ පනතේ පළමු වැනි උප ලේඛනයේ, 1962 ඔක්තෝබර් පළමු වැනිදයින් පටන් ගෙන, 1963 සැප්තැම්බර් 30 වැනිදයින් අවසන් වන මුදල් වර්ෂයේ පොදු සේවාවන් සඳහා ගෙවිය හැකි ප්‍රමාණයන් කොටස් කොට දක්වා ඇත. ඒ ඒ පොදු සේවා ශීර්ෂ යටතේ ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණය රුපියල් එකසිය අනූහත් කෝටි එකොළොස් ලක්ෂ විසි හතර දහස් හාර සිය පනස් හත රක් වෙයි.

මේ පනතේ දෙවැනි උප ලේඛනයෙන්, රජයේ කටයුතු ඒ ඒ දෙපාර්තමේන්තු යටතේ බෙද ඒ ඒ ශීර්ෂ යටතේ ලැබිය හැකි උපරිම වියදම් සීමාව, රජයේ කටයුතු ගිණුම්වලට බැර වශයෙන් ලැබිය හැකි උපරිම සීමාව, රජයේ කටයුතු සඳහා හර වශයෙන් ලැබිය හැකි උපරිම සීමාව, සහ රජයේ කටයුතු සඳහා ලැබිය හැකි වගකීම්වල උපරිම සීමාව, දක්වා ඇත.

# ආ 1962 දී මුදල් මණ්ඩලය විසින් සකස් කැරුන ප්‍රධාන පාලන විධිවිධාන

(i) චක්‍රලේඛ අංක 17

1962 දෙසැම්බර් 28 වැනි දින,
කොළඹ 1.
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. අංක 590,

## වෙළෙඳ බැංකු ණය

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, ණය සීමා කිරීමේ සිය පොදු ප්‍රතිපත්තියට අනුව, ලංකාවාසීන්ට හෝ ලංකාවේ ලියා පදිංචි සමාගම් වලට හෝ විදේශීන් සතු වූ හෝ සතු නොවූ හෝ වතු මිලයට ගැනීම සඳහා දෙනු ලබන වෙළෙඳ බැංකු ණය, එම වතු මිලයට ගැනීමේ දී ගෙවනු ලබන මුදලෙන් සියයට 33⅓ කට වැඩි නොවිය යුතු යැයි, අද සිට බලපවත්වන සේ, නියෝග කොට තිබේ. මෙකී සීමා කිරීම, ලංකාවාසීන්ට හෝ ලංකාවේ ලියාපදිංචි සමාගම් වලට හෝ ලංකාවෙන් පිටත වාසය කරන්නන් සතු හෝ ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමක් සතු හෝ නිශ්චල දේපොළ (වතුහැර) මිලයට ගැනීම සඳහා දෙනු ලබන, බැංකු ණය සම්බන්ධයෙන් ද, බලපවත්වනු ලැබේ.

1957 අගෝස්තු 20 වැනි දින හා අංක බීසී/2/57 දරන චක්‍ර ලේඛය, මෙයින් වහාම ඉවත් කර ගනු ලැබේ.

ඩී. ඩබ්ලිව්. රාජපතිරාන
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

එස්. ඩී. අමරසිංහ
ප්‍රධාන ගණකාධිකාරී,
ශ්‍රී ලංකා මහ බැංකුව

**(ii) එක්සත් ජනපදයේ ඩොලර් සඳහා මහ බැංකුවේ විනිමය ප්‍රමාණය**

| දිනය | චක්‍රලේඛ අංකය | | මිලයට ගැනීම් (ඩොලර් 100 කට) | විකිණීම (ඩොලර් 100කට) |
|---|---|---|---|---|
| 62–2–27 | 1/185 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·25<br>රු. 474·25 | රු. 474·50<br>මසකට සත –/25 ක අධිමිලක් එතැන් මිලට එකතුව |
| 62–4–4 | 1/186 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 473·85<br>රු. 473·85 | රු. 474·10<br>මසකට සත –/25 ක අධිමිලක් එතැන් මිලට එකතුව |
| 62–6–6 | 1/187 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·50<br>රු. 474·50 | රු. 474·75<br>මසකට සත –/25ක අධිමිලක් එතැන් මිලට එකතුව |
| 62–6–25 | 1/188 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·25<br>රු. 474·25 | රු. 474·50<br>මසකට සත –/25 ක අධිමිලක් එතැන් මිලට එකතුව |
| 62–7–9 | 1/189 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·50<br>රු. 474·50 | රු. 474·75<br>මසකට සත –/25 ක අධිමිලක් එතැන් මිලට එකතුව |
| 62–8–3 | 1/190 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 474·75<br>රු. 474·75 | රු. 475·00<br>මසකට සත –/25 ක අධිමිලක් එතැන් මිලට එකතුව |
| 62–8–27 | 1/191 | එතැන්<br>ඉදිරි තෙමස දක්වා | රු. 475·00<br>රු. 475·00 | රු. 475·25<br>මසකට සත –/25 ක අධිමිලක් එතැන් මිලට එකතුව |